විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක : 07/2020

මගේ අංක : විවැ/චක්‍රලේඛ 2020
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.
2020.06. 11

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

<u>විශ්‍රාම වැටුප් ලබන අයෙකුට විශ්‍රාම වැටුප් ලබා ගැනීමට පැමිණීම අපහසු අවස්ථාවක භාරකරුවෙකු පත් කිරීම පිළිබඳ ගිවිසුම</u>

විශ්‍රාම වැටුප භාරකරුවෙකු වෙත ගෙවීමට සිදුවන අවස්ථා වල එම ක්‍රියාවලිය නිවැරදිව හා වඩාත් විශ්වාසදායී අයුරින් සිදු කිරීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය, සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් ක්‍රමය හෝ වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ බලසේනා) විශ්‍රාම වැටුප ක්‍රමය යටතේ විශ්‍රාම වැටුපක් / පාරිතෝෂිකයක් / හිඟ විශ්‍රාම වැටුපක් / හිඟ පාරිතෝෂිකයක් හෝ දීමනාවක් යන ප්‍රතිලාභයක් හෝ ප්‍රතිලාභ හෝ දෙනු ලැබූ විශ්‍රාමිකයෙකු නැතහොත් ලබන්නට සිටින රජයේ නිලධාරියෙකු තදබල ලෙස රෝගාතුර වීම/ සිහිවිකල් වීම/ දුබලතාවයට පත්වීම හෝ වයස්ගත වීම හේතුවෙන් ඉහත කී ප්‍රතිලාභ හෝ ප්‍රතිලාභයක් ලබා ගැනීමට පැමිණීම අපහසු අවස්ථාවක භාරකරුවෙකු වෙත හෝ ආයතනයට විශ්‍රාම වැටුප හෝ ඉන් කොටසක් ගෙවීම සඳහා මෙහි සඳහන් ක්‍රියාමාර්ගය අනුගමනය කළ යුතුය.

03. එලෙස භාරකාර විශ්‍රාම වැටුප් ගෙවීමේදී විශ්‍රාම වැටුප් ලාභියාට උපරිම ප්‍රතිලාභය හිමි වන ලෙසට හා ගෙවනු ලබන විශ්‍රාම වැටුප බාහිර පුද්ගලයෙකු ප්‍රයෝජනයට ගැනීම වැළැක්වීම සඳහා භාරකරුවෙකු පත් කරනු ලබන අවස්ථාවේදී මේ සමඟ ඇමුණුම් කර ඇති ගිවිසුම් අංක 01, 02, 03, 04, 05, 06 හා 07 පරිදි ගිවිසුම් ගත වීම සිදු කල යුතුය.

04. ඉහත සඳහන් කර ඇති පරිදි අදාල ගිවිසුම් සම්පූර්ණ කිරීම මේ වන විට විශ්‍රාම වැටුප් ලබමින් සිටින නිලධාරීන් 2020.07.31 දිනට පෙර සිදුකල යුතු අතර මින් ඉදිරියට නිලධාරියෙකු විශ්‍රාම ගැනීමේදී හෝ එසේ භාරකරුවෙකු පත්කිරීමට සිදුවූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි තමාට අදාල ගිවිසුම සම්පූර්ණ කිරීම සිදු කළ යුතුය.

**ඒ.ජගත් ඩී.ඩයස්**
**විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්**

පිටපත් :-

1. ජනාධිපති ලේකම් - කාරුණික දැන ගැනීම සඳහා
2. අග්‍රාමාත්‍ය ලේකම් - කාරුණික දැන ගැනීම සඳහා
3. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
4. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
5. විගණකාධිපති - අවශ්‍ය කටයුතු සඳහා